# විශ්මජනක සොයායෑම



P.G.N.ලෙහන්සා රසාංජණී

# විශ්මජනක සොයායෑම

P.G.N.ලෙහන්සා රසාංජණී
කතෘ

මහාමායා බාලිකා විදුහල
9 ශ්රේණිය B
2026.05.29

ISBN-978-624-211-338-8

# පිදුම

මාගේ පවුලේ සියලු දෙනාටත්
මහාමායා මවටත්
ලංකා මාතාවටත්

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන

1.පාළු දිනයක්
2.මිනීමැරුමක් !
3.ගනුදෙනුකරුවා
4.මිනීමරුවා කොලින් ද?
5.පුදුමයක්!
6.රහස් කුටිය
7.සැඟවුණු අමුත්තෙක්?
8.අවසානය

# 1.පාළු දිනයක්

" හායි!"ඔහු මට  සුබ පැතුවේ ඉතා මිහිරි හඬකිනි."හායි!"මම ද පිළිතුරු වශයෙන් කීවෙමි"අද සුන්දර දවසක් නේද?" ඔහු කීවේය.
"මට නම් එහෙම නෑ."
"ඇයි ඒ ?"
" මම විහිළුවක් කළේ ."
එදින ඇත්ත වශයෙන්ම සුන්දර දවසකි . කුරුල්ලන්ගේ මිහිරි හඬ දසතින්ම පැතිර ගියේ ය.එදින මම නිවසේ සිටියේ තනිවම ය.එම නිසා මම එදින එළිමහනට පා නැගුවෙමි.එවිට මා දුටුවේ නිතර හමුවීමට එන මාගේ නෑදෑ සොහොයුරු ක්රේවන් ය.එදින  ඇරඹුණේ ද ක්රේවන්ගේ සුබ පැතුමෙනි.
" ඉතින් කොහොමද?" ඔහු විමසුවේ ය.
" මම ඉතා හොඳින් .හැබැයි ටිකක් පාළුයි.කම්මැළියි.දැන් ඔය පාළු ගතිය ඇරිල යාවි.ඔයා ආවනේ."
" ඕ සමාවෙන්න..මම නිකන් ඔයාව හමුවෙලා යන්න ආවේ.මොකද මම අද යන්න ඕනේ.මගෙ යාළුවෙකුගෙ ගෙදර .පොඩි ගනුදෙනුවකට."
" ඕ හරි හරි කිසි ප්රශ්නයක් නෑ..ඔයා යන්න දැන්ම මොකද වැඩේට පරක්කු වෙයි.බායි!"
"බායි!"

***

ඊට පසු දින ඉතාමත් පාළු දිනයකි.එදින ඔහුද නොපැමිණියේ ය. ක්රේවන් සෑම දිනම මාව හමුවීමට පැමිණෙයි . එහෙත් ඔහු අද නොපැමිණියේ ය. පාළු කම නිවීයාමට මම එදින ද එළිමහනට බැස්සෙමි.එවිට මම දුටුවේ දනි පනි ගගා දුවගෙන එන මගේ යාළුවෙකු වූ කොලින්ය.
" හායි කොලින්!" මම හඬනගා ඔහුට කතා කළ  විට ඔහු දුවගෙන ආවේ සතුටින් නොවේ.
" අක්කේ  , ඔයාගෙ ගෙදරට ඊයෙ ක්රේවන් ආවා නේද?"
" ඔව් , එයා අද ආවේ නෑ.ඇයි?"
"නෑ මේ ...එයා ....අතුරුදහන්! "
" මොනවා!"
" මම හිතන්නේ ....එයා මැ....මැරිලා !"



# 2.මිනීමැරුමක් !

" මොකක්!"
" හ්ම්..මම ඇත්ත කියන්නේ "
" හරි..නෑ.. සන්සුන් වෙන්න " මම හිතෙන් මට ම කියා ගත්තෙමි.
" හරි ඔයා කොහොමද දැන ගත්තේ ?"
"මෙන්න." ඔහු මා අතට ලියුම් කැබැල්ලක් දුන්නේ ය.

"ආදරණීය මල්ලී,
මේ ලියුම් කැබැල්ල ඔයා අයිරින් අක්කට දෙන්න.
එයාට කියන්න හරියට ම මේ දැන් තණ පිට්ටනියට එන්න කියලා
ඉක්මනට ! මේක හදිස්සියක්"

" මට සමාවෙන්න .මම හිතුවෙ මේකවෙන කෙනෙක් ලියපු එකක් කියලා.ඒක නිසා මම ඔයාට කතා නොකර තණ පිට්ටනියට ගියා.යද්දි මට තව කොලයක් හම්බ වුණා .ඒකෙ තිබ්බේ මෙහෙම."

"කාලය අවසන් ඔහු........ "

" මේක අපහැදිලියි"
" හ්ම්..ඒ කියන්නේ"
" මේක අවුල් ජාලයක්"
මම නැවත නිවසට ගියෙමි.ගොස් මම කල්පනා කරේ ඔහු අත්තටම මිය ගියාද යන්නයි..එය මිනීමැරුමක්ද? නැත්නම්..අනේ දෙවියනේ! බොහෝ දුරට මෙය මින්කිමැරුමක් විය යුතුයි.මොකද ඔහු අවසන් ලියුමේදී ' ඔහු ' කියල සදහන් කර තිබුණා. නිසැකවම ඒ ඔහු පෙර දිනයේදී මා සමග කියූ ගනුදෙනුකරුවා විය යුතුයි.එසේනම් ක්රේවන්ට හිරිහැරයක් කර ඇත්තේ එම ගනුදෙනුකරුවා විය යුතියි.එම ගනුදෙනුකරුවාව සොයා ගත් පසු මෙම අභිරහසද විසදෙනු ඇත.



# 3.ගනුදෙනුකරුවා

මම පසු දින මෙම ගනුදෙනුකරුවා කවුදැයි සෙවීමට පිටත්ව ගියෙමි.ඒ කොලින්ද සමගය. එහෙත් අපි  කල්පනා කළේ මොහු සොයාගන්නේ කෙසේදයි කියායි.ලියුම් කැබැල්ල තණ පිට්ටනියේ තිබුවද ඒ පෙර දිනයේ ය. දැන් ඔහු සිටින්නේ කොහේද වග අප දෙදෙනාගෙන් කවුරු හෝ දැන සිටියේ නැත..නමුත් පෙර ලියුම් කැබැල්ල තිබූ තණ පිට්ටනියට අපි පිය නැගුවේ සිතේ යම්කිසි විශ්වාසයක් රදවාගෙනය. එය අසාර්ථක වේ දෝයි බියක්ද තිබුණි.කෙසේ වෙතත් එය අසාර්ථක ප්රයන්තයක් නොවන බව මට වැටහුණේ එක් වරම සිදි වූ කොලින්ගේ කෑ ගැසීම හේතුවෙනි.

"පුදුමයි! අර බලන්න තව කොලයක්.මම පෙරේදා රෑ මෙතනට ඇවිත් හොදට සෝදිසි කරලනේ ගියේ.ඒත් මේ කොල දෙක විතරයි මට හොයාගන්න පුළුවන් වුණේ." පෙර ඔහු සොයාගත් කොල දෙක පෙන්වමින් කීවේ ය.

" සමහරවිට මේක ඒ ගත්ත කොලේක අස්සේ තිබිල වැටෙන්න ඇති.."
" මොනාද  මේකෙ තියෙන්නේ කියලා බලමු.."

**රෝස්  වීදිය 223 B**
**තණ පිට්ටනියේ සිට  20m**

**"**මොකක්! මේකෙ ලිපිනයක් ලියල තියෙනවා!"
" ඇත්තට ..ඉතින් ඒකෙ තියෙන විශේෂිත දේ මොකද්ද ?.." එක් වරම කොලින් විමසුවේ ය. ඔහු එම නැගු පැනයෙන් මට මදක් තරහ ගියේය..
" මොකද්ද? ඔයාට ඒකෙ අගේ තේරෙන්නෙවත්  නැද්ද? ..ඔයාට පිස්සුද  ඇත්තටම..!?"
" ආ .දැන් ඔයා මාත් එක්ක රණ්ඩු කරන්න එනවද? ඔයාට බෑ මන් නැතුව මේ කේස් එක විසදගන්න.."
" මට බෑ? ඔයා කොහොමද එහෙම කියන්නේ? මට පුළුවන්.. ඔයාට මට උදවු කරන්න බැරිනම් දැන්ම මෙතනින් ගියත් මට ප්රශ්නයක් නෑ. මොකද මේ රටේ පොලීසිය කියලා දේකුත් තියෙනවනේ. මට ඒකෙන් සහාය ගන්න පළුවන්.."
" හෝව්   හෝව්.. හදිසි වෙන්න එපා.මම ..මම ...හා...මට සමාවෙන්න..හරි දැන් අපි රණ්ඩු වුණේ නෑ.. පොලිසියට කියන්නෙත් නෑ"
පොලීසිය යන වචනය පැවසු සැටියෙන් ඔහුගේ එම වෙනස්වීම පිළිබදව මම මදක් විස්මයට  පත් වූයෙමි..

"හරි හරි..අපි එහෙනම් මේ ලිපිනය ගැන හෙට බලමු..අද දවසේ අපි ගොඩක් දේවල් කරානෙ.."
"හරි.."



# 4.මිනීමරුවා කොලින් ද?

අපි නිවෙස්වලට ගිය පසු මම මේ අභිරහස පිළිබඳ ව තවදුරටත් කල්පනා කළෙමි..ඇත්තට ම මෙම ලියුම කොලින්ට හමුවූයේ කෙසේද? ඔහු ක්රේවන්ගේ එතරම් හිතවත් අයෙකුත් නොවේ.එසේ නම් ඇයි ක්රේවන් ඔහුටම ලියුම ලියන්නා සේ 'ආදරණීය මල්ලී ' යනුවෙන් සදහන් කර ඇත්තේ? මේ ආදී ප්රශ්න බොහෝමයක් මගේ සිතට ගලා ආවේ විශාල දියඇල්ලක් පහලට වේගයෙන් ඇද හැලෙන අයුරිනි.මෙම ගනුදෙනුකරුවා කවුද? ඔහුට ඇත්තෙන්ම අවශ්ය වී ඇත්තේ කුමක්ද? කොලින් මෙය සිදු කරනවාද? මෙය කොලින්ගේ රග පෑමක්ද? එසේත් නැතිනම් කොලින් ද මෙම අපරාධය සිදු කර ඇත්තේ ? මේ ආදි දෑ සිතමින් සිටින විට මා හට නොදැනිම නින්ද ගොස් ඇත.

***

මා අවදි වන විට වේලා හවස 5 පමණ විය.මට එක්වරම සිහියට නැගුනේ කොලින්හේ අකුරුයි.මෙය මාගේ සිතිවිලි දාමයට එක් වූ වහාම මම කොලින්ගේ අකුරු බැලීමට ඔහුගේ නිවසට යෑමට තීරණය කළෙමි.

***

" කොලින්" මම ඔහුට කතා කළෙමි.
" ඔව් අයිරින් අක්කේ.කියන්න"
"අහ්..මෙ...ම..මම මේ ආවේ මේ ඔයාගෙ පරණ පොත් චුට්ට්ටක් බලන්න.. මට ආස හිතුණා..ඇත්තටම.."
" හ්ම්.." ඔහු මද සිනාවක් පා ඔහුගේ පැරණි අකුරු මට වෙනම කොලේක ලියා පෙන්නුවේ ය. ඒ ලියා පෙන්නුවේ ' රෝස් වීදිය 223B තණ පිට්ටනියේ සිට 20m ' යන්නයි.එයින් මට පැහැදිලි වූයේ මොහු මාගේ සිතිවිලි වටහා ගත් බවයි.ඇත්තෙන්ම පෙර අකුරු හා සසදන විට මෙම අකුරු වෙනස් විය..නමුත් මට දැකගන්නට හැකි වූයෙ කොලින් එම අකුරු යම්කිසි අපහසුවකින් ලියන බවයි.

" මට සමාවෙන්න කොලින් ඔයාව ..."
" ඒකට කමක් නෑ මම දන්නනවා ඔයාට ක්රේවන්ව වටිනව කියල... ඊයෙ අර විදිහට කිව්ව එක ගැන මටත් සමාවෙන්න."

# 5.පුදුමයක්!

පසුදින මම කොලින් සමග නැවත අභිරහස විසදීම සදහා පිටත්ව ගියෙමි.අපි නැවත පැමිණියේ තණ පිට්ටනියටයි.අපි පෙර ලියුම් කැබැල්ල තිබූ ස්ථානයේ සිට 20mක් ඉදිරියට ගියෙමු.විස්මයකි! එතැන බිම තණ වලට වැසී කුඩා බොත්තමක් සැගවී තිබුණි.මම එතැනට ගියෙමි. ඇත්තෙන්ම මට පෙර එය කොලින් දුටු නමුත් ඔහු එය නොදැක්කා සේ සිටියේ ය. කොලින්හේ මෙම නොරිස්සුම් සහගත හැසිරීම මා හට රිස්සුවේ නැත.

මම එම බොත්තම එබුවෙමි .විස්මය දෙගුණ තෙගුණ කරමින් එතැන පොළොවෙන් මතුවුණේ විශාල බිම් ගෙයක් වැනි තැනකි.එය බෙහෙවින් අන්ධකාරයෙන් ආලෝකමත් වී තිබුණි..

" යමු..මේක තමයි වෙලාව " මම කීවෙමි.එවිට කොලින් කිසිදු විස්මයකින් තොරව එම ස්ථානය තමා මීට පෙර දන්නා ස්ථානයක් මෙන් මා පසුකර ඔහු එතැනට ළගා වූයේය .
" එන්න අපි යමු .."

***

එම ස්ථානය බෙහෙවින් අදුරු වුවද පෙර සූදානමක් ලෙස මම විදුලි පන්දමක් ද රැගෙන ආවෙමි.අපි දෙදෙනාම එම කර්මාන්ත ශාලාව වැනි තැනට ගියෙමු.එක්වරම මා හට යමෙකුගේ කෑ ගැසීමක් ශ්‍රවණය විය.මම කොලින් දෙස බැලුවෙමි.ඔහු කිසිදු හැල හොල්මනක් නොමැතිව ඔහේ බලාගෙන සිටියේ ය. මෙවැනි හැසිරීම් නිසා මට කොලින් පිළිබද තිබූ සැකට යලි මතුවන්නට විය.



# 6.රහස් කුටිය

" කොලින් ..ඔයාට ඒක ඇහුණද?"
" මොකද්ද?"
නැවතත් එම ශබ්දය ඇසුණි.
"ඔය ..දැන් ඇහුණද?"
" නෑ.."
" කවුරුහරි කෑ ගැහුවා"
" ඔයාට පිස්සුද අක්කෙ?
" මට නෙවෙයි..ඔයා බයවෙලා නේද ඉන්නෙ?.."
" මම..මම බය වෙන්න පිස්සුද?"
එහෙනම් ඔයාගෙ හැසිරිම ඇයි අමුතු?"
" හරි හරි..මම මම බයවෙලා තමයි ඉන්නෙ. .දැන් හරිනේ ".
එක්වරම මාගේ නෙත ගැටුණේ දොරටුවකි.මම එය අසලට ගියෙමි.එය බෙහෙවින්ම අඳුරේ ගිලී තිබිණි .
" අපි යමු මේක ඇතුළට " කොලින් එයට එකග විය

***

අපි එය තුළට ගියා පමණි එක් වරම මෙම දොර වැසුණි.
" අනේ අක්කේ. දැන් නම් මට ඇත්තටම බයයි..තවත් නම් ඉස්සරහටයන්න බෑ"
" ඔයාට පිස්සු හැදීගෙන එනවද? අපි මේකෙ ඇතුළෙ හිටියොත් මැරිල යයි.." අපි තවත් ඉදිරියට ගියෙනු..එක්වරම මා දුටුවේ ගලක් මත් තිබූ ලියුම් කැබැල්ලකි.මම එය අතට ගත්තෙමි.

' පරිස්සම් වෙන්න. එයා ඔයාගෙ පිටිපස්සෙ..එයා ඔයාව ලොකු කුමන්ත්‍රණකට අහු කරන්නයි යන්නේ.බය වෙන්න එපා මම හොදින්.එයාගෙ මායම්වලට අහුවෙන්න එපා.මම ඔයාව බේරගන්නම්" යනුවෙන් එහි සදහන්විය." මමතමියි සැගවුණු අමුත්තා " යනුවෙන් ද එහි තව දුරටත් සදහන් වී තිබුනි.

# 7.සැගවුණු අමුත්තෙක්?

"යමු ඉදිරියට" මම කීවෙමි.අපි රහස් කුටිය පසුකරමින් ඉදිරියට ඇදුණෙමු.එය තවත් අඳුරු විය.ඒත් සමගම කෑ ගැසීම් ද බොහෝ ඇසුණි.ඒ සෑම අවස්ථාවකම කොලින්ගේ හැසිරීම බොහෝ සේ වෙනස් විය.එක්වරම අපි පිවිසියේ විශාල කාමරයකට ය.
" වාව් ! කාමරයක්! "
" නෑ කාමරයක් නෙවෙයි"මා පුදුමයට පත් කරමින් කොලින් කීවේ ය.
" මොනවා! කොලින් මොනාද ඔයා මේ කියවන්නෙ? ඔයා හොඳින්ද?"
" ඉස්සරහට යන්න ඒකනෙ ඔයාට ඕනි." කොලින් කීවේ වියරුවෙන් මෙනි.
" එපා !" එක්වරම මට ඇසුණේ පිරිමි කටහඬකි. ඔව්. ඒ ක්රේවන්ය. මම පුදුමයටත් සතුටටත් පත් වූයෙමි.මීළඟ නිමේෂයේදී ක්රේවන් දුවැවිත් කොලින්ව ඉතා විශාල ආගාධයකට ඇද දැමුවේ ය.
" ක්රේවන් ..මොක්..මොක..මොකද්ද ? ඔයා ඒ කළේ? "
" කලබල වෙන්න එපා.විස්තර පස්සෙ කියන්නම්..මේක කඩාවැටෙන්න්නයි යන්නෙ. ඉක්මනට පැන ගමු.."
මම අවසිහියෙන් මෙන් ක්රේවන් පසුපසින් දුවගෙන ගියෙමි..අවසානයේ අපි එළියට පැමිණියෙමු.



# 8.අවසානය

"ක්රේවන්?!"
" සන්සුන් වෙන්න" ඔහු පැවසුවේ ය.
" අපි ගෙදරට ගිහින් කතා කරමු"

***

" එයා හැදුවේ ඔයාව මරන්න .එයා මට කියලා ලියුම් ලියාගත්තා.එයා මාව බය කරා. "
" මමත් ගොඩක් බයවුණා. ඇත්තටම මට ...මම මෝඩියෙක් වගේ වැඩ කරේ එවෙලේ"
" කමක් නෑ .ඒ ඔක්කොම ඉවරයි. ආය ඔය වගේ දේවල්වලට රැවටෙන්න එපා."
ඔහුපැවසුවේය.
"ආය නම් නෑ. " ඔහු මට සුබ පතා නිවසින් පිටවී ගියේ ය. බිහි සුණු ඛේදවාචකයක් එලෙසින් නිම වුණි. මෙවැනි සිදුවීමක් නැවත් නොඑන ලෙස මම ප්රාර්ථනා කළෙමි.

## නිමි

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සම්බළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN - 978-624-211-338-8